
2 වැනි සැසිය

**සිතීමේ, හෘදය සාක්ෂියේ, ආගම ඇදහීමේ සහ විශ්වාස දැරීමේ නිදහස හඳුන්වාදීම**

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත




THE LOCAL
CHANGEMAKERS
COURSE

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත

## සිතීමේ, හෘදය සාක්ෂියේ, ආගම ඇදහීමේ සහ විශ්වාස දැරීමේ නිදහස හඳුන්වාදීම

*2 වැනි සැසියේ ඉදිරිපත් කිරීමට අදාළ වන මෙම කථන පිටපත, සැසියේ පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමෙහි අංක 25 සිට 46 දක්වා වන ස්ලයිඩ මගින් නිරූපණය කර තිබේ.*

සටහන: මෙම ඉදිරිපත් කිරීම තුළ 'නළාවේ සහ බෙරයේ ගීත' යන කතන්දරය පිළිබඳව සඳහන් වේ. ඔබේ කණ්ඩායම සඳහා මෙම කතන්දරය භාවිතා කිරීමට ඔබ අදහස් නොකරන්නේ නම්, ඔබට මෙම කථන පිටපත සංස්කරණය කර ගැනීමට සිදු වනු ඇත. පහසුකම් සපයන්නන්ගේ මාර්ගෝපදේශයේ 55 වැනි පිටුවෙන් සහ මෙම සබැඳිය මගින් ඔබට එම කතාව ලබා ගත හැක.

**හැඳින්වීම**




ඉතින්, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස මගින් ආරක්ෂා කරන්නේ කවුරුන්ව ද, නැතහොත් කුමක් ද?

තර්කානුකූල පිළිතුර නම් ආගම් සහ විශ්වාස යැයි ඔබට සිතෙන්නට පුළුවන්. නමුත් ඇත්ත වශයෙන්ම, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස මගින් ඒ තුළ ඇති ආගමික හෝ වෙනත් විශ්වාස ආරක්ෂා කරන්නේ නැහැ. එය දෙවියන් වහන්සේව හෝ පූජනීය දේ ආරක්ෂා කරන්නේ නැහැ. අනෙක් සෑම මානව හිමිකමක් මගින් මෙන්ම මෙමගින් ද ආරක්ෂා කරන්නේ මිනිසුන්වයි.

මෙම අයිතියට කියන සම්පූර්ණ නම, සිතීමේ, හෘදය සාක්ෂියේ, ආගම ඇදහීමේ සහ විශ්වාස දැරීමේ නිදහසට ඇති අයිතිය යි. මෙම අයිතිය මගින් පුද්ගලයා කවුරුන්ද, ඔවුන් විශ්වාස කරන්නේ කුමක්ද, ඔවුන් කවර ආගමකට අයත්ද යන්න නොසලකා සෑම මිනිසෙකුගේ ම අයිතිවාසිකම් ආරක්ෂා කරනවා.





ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස නිදහස පදනම් වී ඇත්තේ සියලු ම මිනිසුන්ට පහත සඳහන් මූලික අවශ්‍යතා ඇත යන අදහස මතයි:

- සිතීමටත්, යහපත් හා සත්‍ය දේ කුමක්දැයි තමන්ට ම තීරණය කිරීමටත් ඉඩ දෙනු ලැබීමට;
- පොදු විශ්වාස, පිළිවෙත් සහ අනන්‍යතා සහිත කණ්ඩායම් වලට අයත් වීමට; සහ
- අදහස් හා පිළිවෙත් ප්‍රශ්න කිරීමට, සහ ඔවුන් විශ්වාස කරන දේ ගැන ඔවුන්ගේ මනස වෙනස් කර ගැනීමට සහ ඔවුන්ගේ හෘදය සාක්ෂියට විරුද්ධ දේ කිරීම ප්‍රතික්ෂේප කිරීමට.

සිතීමට, විශ්වාස කිරීමට, අයත් වීමට, ප්‍රගුණ කිරීමට, ප්‍රශ්න කිරීමට, මනස වෙනස් කර ගැනීමට සහ ප්‍රතික්ෂේප කිරීමට.

**අපට ඇති අයිතිවාසිකම් මොනවාද?**




ඉතින්, අපට ඇති අයිතිවාසිකම් මොනවාද? අපි දැන් සම්මුතිවල සඳහන් වෙලා තියෙන දේ දෙස බලමු.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) 18 වැනි වගන්තිය මගින් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස ආරක්ෂා කර තිබෙනවා. මෙය නීතියෙන් බැඳී සිටිය යුතු වන ගිවිසුමක් වන අතර, රටවල් 173 ක් මෙම ජාත්‍යන්තර නීති අනුගමනය කිරීමට පොරොන්දුවී සිටිනවා. (*සහභාගීවන්නන්ගේ රට ද මෙම සම්මුතිය පිළිගෙන තිබේ දැයි ඔවුන්ට පවසන්න.*)




එහි 18 වැනි වගන්තියේ පළමු වැනි වාක්‍යයේ මෙසේ සඳහන් වෙනවා:
"සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගම ඇදහීමේ නිදහස සෑම පුද්ගලයෙකුට ම තිබිය යුතු ය."




තමන් ගැහැණු ළමයෙක් වුනත් තමන්ට නළාව පැළඳීමට ඉඩ දිය යුතු යැයි සිතූ, කතන්දරයේ ඉන්න සියානා ට වගේ සෑම කෙනෙකුට ම තමන් විසින් ම සිතීමට අයිතියක් තියෙනවා.




තමන්ගේ පියාගේ ක්‍රියා වැරදි යැයි විශ්වාස කළ නිසා පියාට උදව් කිරීම ප්‍රතික්ෂේප කරපු බ්‍රෝන්ට වගේ අපගේ හෘදය සාක්ෂියට ඇහුම්කන් දීමට අපටත් අයිතියක් තිබෙනවා.




විශ්වාස දැරීමට හා අයත් වීමට, එනම් ආගමික හෝ ආගමික නොවන විශ්වාස දැරීමට සහ ආගම හෝ විශ්වාසය පදනම් කර ගත් අනන්‍යතාවයක් ඇති කර ගැනීමට අපට අයිතියක් තිබෙනවා. නළාවේ සහ බෙරයේ ගීත කතාවේ ගම්වැසියන් මෙන් අපගෙන් බොහෝ දෙනෙක් ද අවංක විශ්වාස දරනවා. අපගේ විශ්වාස සහ අපි එම විශ්වාස බෙදාගන්නා පුද්ගල ප්‍රජාව අපට විශාල වශයෙන් වැදගත් වෙනවා.




නමුත් අපි ජීවත් වන්නේ කුමන සමාජයක වුනත්, අපගේ විශ්වාස කෙතරම් සත්‍ය සහ නිවැරදි වුනත්, තමන්ගේ නළාව ගලවා දමා තම ප්‍රජාව හැර ගිය බ්‍රෝන් වගේ කුමන හේතුවක් නිසා හෝ තමන්ගේ විශ්වාස හෝ තමන්ගේ ප්‍රජාව කෙරෙහි විශ්වාසය නැති වුණු අය ඉන්න පුළුවන්.




ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ දී, ඔබේ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිය සමග ම ඔබේ ආගම හෝ විශ්වාස හැර යාමට සහ වෙනස් කිරීමට ඇති අයිතියත් ආරක්ෂා වෙනවා.




සිතීමට, විශ්වාස කිරීමට, ප්‍රශ්න කිරීමට සහ අපගේ විශ්වාස වෙනස් කිරීමට ඇති මෙම අයිතිවාසිකම් බොහෝ විට අභ්‍යන්තර නිදහස ලෙස හඳුන්වනවා. ඒවා අපගේ මනසේ සහ අපගේ ආත්මයේ සිදු වෙමින් පවතින දේවල් පිළිබඳව වන අතර, එය අපගේ අනන්‍යතාවයට, ඒ කියන්නෙ අපි කවුරුන්ද යන්න පිළිබඳ අප තුළ ඇති හැඟීමට අදාළ වෙනවා.


මේ හේතුව නිසා ඒවා පරම අයිතිවාසිකම් වෙනවා. ජාත්‍යන්තර නීතිය යටතේ කිසි විටෙකත් මෙම අයිතිවාසිකම් සීමා කිරීමට කිසිදු පුද්ගලයෙකුට හෝ රජයකට අවසර නැහැ.

නමුත් ඇත්ත වශයෙන්ම, ආගම සහ විශ්වාස කියන්නෙ අපේ මනසේ හා ආත්මයේ සිදුවන දෙයට වඩා බොහෝ සෙයින් වැඩි දෙයක්! අපි කරන දේ ගැනයි – වචන සහ ක්‍රියාවන් තුළින් අපගේ විශ්වාස ප්‍රකාශ කරන ආකාරය ගැනයි එයට ඇතුළත් වෙනවා.




අපි අහපු කතන්දරයේ, ගම්වැසියන්ගේ ජීවිත නළා පැළඳීමේ සිට එදිනෙදා ජීවිතයේ බෙර වාදනය දක්වා වූ ඔවුන්ගේ විශ්වාස හා අයත්වීම ප්‍රකාශ කෙරෙන පිළිවෙත් වලින් පිරී තිබුණා.

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස හරහා මෙම අයිතිවාසිකම් ද ආරක්ෂා කරනවා. අපි නැවත සම්මුතිය දෙස බලමු:




18 වැනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

> "පුද්ගලිකව හෝ ප්‍රජාව තුළ වෙනත් අය සමග සහ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව, වන්දනා කිරීමේ දී, පිළිපැදීමේ දී, ප්‍රගුණ කිරීමේ දී සහ ඉගැන්වීමේ දී තම ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති නිදහස ... මෙම අයිතියට ඇතුළත් වන්නේය."

අපිට පුද්ගලිකව යාච්ඤා කිරීමට සහ සාමුහික වන්දනා කිරීම් සහ සම්ප්‍රදායන් සහිතව ප්‍රජාවක කොටසක් ලෙස අපගේ ආගම ඇදහීමට හෝ විශ්වාස ප්‍රකාශ කිරීමට අයිතියක් තිබෙනවා. එම ප්‍රජාවටත් අයිතිවාසිකම් තිබෙනවා – ඒවා තම ප්‍රජාවේ සාමාජිකයන්ව පාලනය කිරීමේ අයිතිවාසිකම් නොවෙයි, ඒවා රාජ්‍යය සම්බන්ධයෙන් පවතින අයිතිවාසිකම්. උදාහරණයක් විදියට, ආගමික හා විශ්වාස ප්‍රජාවන්ට අවශ්‍ය නම් බැංකු ගිණුම් පවත්වා ගැනීමට, මිනිසුන් සේවයේ යෙදවීමට සහ ගොඩනැගිලි අයිති කර ගැනීමට හැකි වන පරිදි ඔවුන්ට නීතිමය අනන්‍යතාවයක් ලබා ගත හැකි බවට රාජ්‍යය සහතික විය යුතුයි.

පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ආගමක් ඇදහීමට හෝ විශ්වාසයක් දැරීමට විවිධ ක්‍රම තිබෙනවා. ආරක්ෂා කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ උදාහරණ එක්සත් ජාතීන්ගේ විශේෂඥයින් විසින් ඕනෑ තරම් ලබා දී තිබෙනවා. උදාහරණයක් ලෙස, අපිට පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන්නට අයිතිවාසිකම් තිබෙනවා:



- වන්දනා කිරීම සඳහා එක්රැස් වීමට, උත්සව සැමරීමට සහ ආගමික පිළිවෙත් කරන දිනවල වතාවත් කිරීමට.
- ආගමික ඇඳුම් ඇඳීමට සහ විශේෂ ආහාර වේල් ගැනීමට.
- පූජනීය ස්ථාන සහ සුසාන භූමි තිබීමට සහ ආගමික සංකේත ප්‍රදර්ශනය කිරීමට.
- සමාජයේ කාර්ය භාරයක් ඉටු කිරීමට; උදාහරණයක් ලෙස, පුණ්‍යායතන පිහිටුවීමට, සහ
- ආගම හෝ විශ්වාස ගැන කථා කිරීමට සහ ඉගැන්වීමට, සහ නායකයින් පුහුණු කිරීමට හෝ පත් කිරීමට.

මෙම අවස්ථාවෙහිදී, ඔබ මෙසේ සිතනවා විය හැකිය: “විශිෂ්ඨයි – මේ ආකාරයේ අයිතිවාසිකම් තමයි මගේ ප්‍රජාවටත් අවශ්‍ය!”. නැති නම් ඔබ කනස්සල්ලට පත්වෙනවා විය හැකියි!

**<u>ස්වේච්ඡාවාදය හා සමානාත්මතාවය – අන් අයට හානියක් නොකරන්න!</u>**



අන් අය කෙරෙහි වෛරය හෝ ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා තම ආගම හෝ විශ්වාස භාවිතා කරන, අන් අයට වෙනස් කොට සලකන හෝ තම කණ්ඩායම තුළ සිටින අන් අයව යටපත් කරන සහ පාලනය කරන පුද්ගලයින් ගැන කුමක් කිව හැකිද?

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස යන්නෙන් අදහස් කරන්නේ, අනෙක් පුද්ගලයින්ට කුමන බලපෑමක් ඇති වුවත්, ඔවුන්ට එසේ කිරීමට නිදහස ඇති බවද?

වාසනාවට එය එසේ නොවේ!

---




මානව හිමිකම් සම්මුතීන් අපගේ අයිතිවාසිකම් මොනවාද යන්න මෙන්ම අපගේ අයිතිවාසිකම් සඳහා ඇති සීමාවන් මොනවාද යන්නත් අපට කියා දෙනවා. වෙනත් ආකාරයකින් කියනවා නම් – අපගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී අප සතු වගකීම් මොනවාද යන්න කියා දෙනවා.

කිසිවෙක් තමන්ගේ අයිතිවාසිකම් සහ නිදහස අන් අයට හානියක් වන අයුරින් භාවිතා නොකළ යුතුයි කියා අපට මෙම වගකීම් සාරාංශගත කළ හැකියි. මානව හිමිකම් සම්මුතීන්ට අනුව මෙය සෑම පුද්ගලයෙකුගේ ම සදාචාරාත්මක යුතුකමක්. සෑම කෙනෙකුගේ ම අයිතිවාසිකම්වලට ගරු කිරීමටත්, සෑම කෙනෙකුම හානිවලින් ආරක්ෂා කිරීමටත් රජයට නීතිමය වගකීමක් තිබෙනවා. දැන් අපි හානිවීමෙන් අප ආරක්ෂා විය යුතු ආකාරය පිළිබඳව වඩාත් පැහැදිලි කරගනිමු.

---




පළමුව: බලහත්කාරයක් නොතිබිය යුතුයි!
ආගම ඇදහීම හෝ විශ්වාස දැරීම යන කාරණාවලදී බලහත්කාරයට අවසර නැහැ. විශ්වාස කිරීම හා අයත්වීම ස්වේච්ඡාවෙන් සිදු විය යුතුයි. යමෙකුට විශ්වාස කිරීමට හෝ විශ්වාස නොකිරීමට, පිළිවෙත් ඉටු කිරීමට හෝ නොකිරීමට, ආගමකට අයත් වීමට හෝ අයත් නොවීමට බලකිරීම සඳහා බලධාරීන්ට, විශ්වාස අදහන ප්‍රජාවන්ට සහ පවුල්වලට තර්ජනය කිරීම්, බිය ගැන්වීම් හෝ ප්‍රචණ්ඩත්වය යොදා ගැනීමට අවසර නැහැ.

---




දෙවනුව: වෙනස්කොට සැලකීම නොකළ යුතුයි!
සම්මුතියේ 2 වැනි වගන්තිය මගින්, ආගම, ජාතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ භාෂාව යනාදී කරුණක් මත, කවර හෝ ආකාරයකට වෙනස්කොට සැලකීම තහනම් කර තිබෙනවා. මානව හිමිකම් ගිවිසුම් අත්සන් කර ඇති රාජ්‍යයන්, සෑම කෙනෙකුට ම එක හා සමානව සැලකීමටත්, අප ඉගෙන ගත් කතන්දරයේ වෙළඳපොළ සභාව විසින් සිදු කරන ලද පරිදි, සමාජයේ වෙනස්කොට සැලකීම අවසන් කිරීම සඳහා ක්‍රියාශීලීව කටයුතු කිරීමටත් එකඟ වී තිබෙනවා.

---




තෙවනුව: අයිතිවාසිකම් විනාශ නොකළ යුතුයි!
5 වැනි වගන්තියේ සඳහන් වන්නේ එක් මානව හිමිකමක් වෙනත් මානව හිමිකම් විනාශ වන අයුරින් ක්‍රියාත්මක කිරීමේ අයිතිය ලැබෙන්නක් ලෙස අර්ථ දැක්වීමට කිසිදු රජයකට, කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට අවසර නැති බවයි.

20 වැනි වගන්තිය මගින් වෙනස් කොට සැලකීමට, එදිරිවාදිකම් වලට හෝ ප්‍රචණ්ඩත්වයට පොළඹවා ගැනීම හරහා ආගමික වෛරය පැතිරීම වෙනුවෙන් පෙනී සිටීම තහනම් කරයි.

යම් ආගමක් තමන්ගෙන් ඉල්ලා සිටින්නේ කුමක්ද යන්න පිළිබඳව රජයක් හෝ පුද්ගලයෙක් කුමක් සිතුවත්, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස මගින් ඔවුන්ට වෙනත් ජනතාවන්ගේ අයිතිවාසිකම් පාගා දැමීමට අයිතියක් ලබා දෙන්නේ

යැයි කිසිවෙකුට තර්ක කළ නොහැකියි. එබැවින්, බෙර වාදකයින්ට හිරිහැර කිරීම නිවැරදි දෙය යැයි බ්‍රෝන් ගේ පියා සිතුව ද, ඔහුට එසේ කිරීමට අයිතියක් නැහැ.

ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය කිරීමට හෝ උසිගැන්වීමට ආගම යොදාගන්නා අවස්ථා හෝ මිනිසුන්ට හානි කරන ආගමික වත්පිළිවෙත් පිළිබඳ උදාහරණ ඕනෑ තරම් ඔබේ සිතට නැගෙනවා ඇති බව මට විශ්වාසයි. මිනිසුන් සාමකාමීව තම ආගම ඇදහීම හෝ විශ්වාස දැරීම අසාධාරණ ලෙස වළක්වන ලද අවස්ථා ගැනද ඔබේ සිතට නැගෙනවා ඇති.

## ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසට ඇති සීමා




එහෙම නම්, මෙම නීති මොනවාද? රජයන්ට ආගම් ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සීමා කරන්නට අවසර ලැබෙන අවස්ථා මොනවාද? අපි මේ නීති පිළිබඳ ඉක්මනින් විමසා බලමු.

පළමුවෙන් ම, සිතීමට හා විශ්වාස කිරීමට ඇති අයිතිය (අභ්‍යන්තර නිදහස) කිසි විටෙකත් සීමා කළ නොහැකියි. දෙවනුව, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සීමා කරනු ලැබිය හැකියි – නමුත් එසේ කළ හැක්කේ පහත සඳහන් නීති හතර අනුගමනය කරන විට පමණයි:

---




1. සීමාව විස්තර කෙරෙන **නීතියක්** තිබිය යුතුයි. වෙනත් වචන වලින් කිවහොත්, පොලිසියට ඔවුන් කැමති කැමති දේ කළ නොහැකියි.
2. පනවන සීමාව, එමගින් විසඳීමට උත්සාහ කරන ගැටලුවට **සමානුපාතික** විය යුතුයි. නිදසුනක් වශයෙන්, යම් විශ්වාසයක් අදහන ප්‍රජාවක ශබ්දවාහිනී පද්ධතිය ඉතා ඝෝෂාකාරී නම්, එහි හඬ අඩු කරන ලෙසට හෝ දඩයකට යටත් වන ලෙස එම ඇදහිලි ප්‍රජාවට නියෝග කරනු ලැබිය හැකියි. ඔවුන් එක්රැස්වීම සම්පූර්ණයෙන් ම තහනම් කිරීම සමානුපාතික නොවෙයි.
3. සියලුම සීමා කිරීම් **වෙනස්කොට සැලකීමෙන් තොර** විය යුතුයි – ඒවා සෑම කෙනෙකුටම අදාළ විය යුතුයි.
4. එම සීමා කිරීම් පහත සඳහන් දේ වලින් එකක් ආරක්ෂා කිරීම සඳහා **අවශ්‍ය** වන ඒවා විය යුතුයි: මහජන ආරක්ෂාව, මහජන සාමය, මහජන සෞඛ්‍යය, මහජන සදාචාරය හෝ පුද්ගලයින්ගේ වෙනත් අයිතීන් සහ නිදහස.

'අවශ්‍ය' යන වචනය ඇත්තට ම වැදගත්. සීමා කිරීම් පැනවීම සුදුසුයි කියා රජය හෝ ජනගහනයෙන් බහුතරයක් විසින් සිතීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ; සීමාව පැනවීම අවශ්‍ය විය යුතුයි. වෙනත් වචන වලින් කිවහොත්, අදාළ අයිතිවාසිකම් සීමා නොකර එම පිළිවෙත් හරහා නිර්මාණය වූ ගැටළුව විසඳීමේ වෙනත් ක්‍රමයක් නොතිබිය යුතුයි. අයිතිවාසිකම් සීමා කිරීම යනු අවසාන විසඳුමකි. එසේ වුවත්, සමහර විට එය අවශ්‍ය වේ.

---




උදාහරණයක් ගනිමු – ඕනෑවට වඩා මිනිසුන් සංඛ්‍යාවක් පූජනීය ස්ථානයකට එක්රැස් වීම අනතුරුදායක විය හැකිය. එබැවින්, මහජන ආරක්ෂාව මත පූජනීය ස්ථානයට ඇතුල්වීමට අවසර දිය හැකි පුද්ගලයින් සංඛ්‍යාව සීමා කිරීමට බලධාරීන්ට අවශ්‍ය විය හැකියි.

කොරෝනා වෛරස් වසංගතය තුළදී වන්දනා කිරීම සඳහා එක්රැස්වීම් සම්බන්ධ මහජන සෞඛ්‍ය සීමා කිරීම් ඉතා සුලභ වී තිබෙනවා – සමහර විට මෙම සීමාවන් අවශ්‍ය, සමානුපාතික හා වෙනස් කොට නොසලකන ඒවා වේ. සමහර විට ඒවා අතිශයින් වෙනස් කොට සලකන හා අසමානුපාතික ස්වභාවයෙන් යුක්තයි.

කාන්තාවන්ගේ ලිංගච්ඡේදනය තහනම් කිරීම අන් අයගේ, එනම් මේ අවස්ථාවේදී ගැහැණු ළමයින්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කරන සීමා කිරීමකට උදාහරණයක්. මෙය සංස්කෘතික හෝ ආගමික පිළිවෙතක් ලෙස සලකනු ලැබුවත්, එය ගැහැණු ළමයින්ගේ සෞඛ්‍යයට අනතුරුදායක වන අතර, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහසට අදාළව එය සාධාරණීකරණය කළ නොහැකියි.

---




මෙම නීති ඇත්තෙන් ම වැදගත්. එම නීති නැති නම් රජයයන්ට තමන් අකැමති ඕනෑම කණ්ඩායමක් හෝ පිළිවෙතක් සීමා කිරීමට හැකියි. සීමා කිරීම් කියන්නේ අවසාන විසඳුමක් මිස රාජ්‍ය පාලනය සඳහා වන මෙවලමක් නොවෙයි. මීළඟ සැසියේදී අපි ලෝකය පුරා සිදුවන විවිධ ආකාරයේ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස උල්ලංඝනයවීම් පිළිබඳව වඩාත් ගැඹුරින් විමසා බලමු.